SEDR
Supporting Effective Dispute Resolution
ඵලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම
பயனுறுதிமிக்கவகையில் பிணக்கை தீர்ப்பதற்கு ஆதரவளித்தல்

# ඵලදායිව ආරවුල් නිරාකරණයට සහායවීම

## ව්‍යාපෘති පසුබිම

ඵලදායීව ආරවුල් නිරාකරණයට සහයවීමේ (SEDR) ව්‍යාපෘතිය වසර හතර (2020-2024)ක කාලයක් තුළ ආසියානු පදනමත් සමග හවුල්කාරිත්වයෙන් යුතුව නිම කිරීමේ කොන්ත්‍රාත්තුව බ්‍රිතාන්‍ය කවුන්සිලය වෙත යුරෝපා සංගමය ලබාදී ඇත්තේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකක වන ප්‍රතියෝජනය, ප්‍රතිසන්ධාන සහ සියලුදෙනාගේ ප්‍රජාතන්ත්‍රවාදී මැදිහත්වීම ශක්තිමත් කිරීමේ (STRIDE) වැඩපිළිමවළට අයත් එක් අංගයක් වශයෙනි. යුරෝ මිලියන 7 ක වටිනාමක් සහිත මෙම ව්‍යාපෘතියෙහි පළමු අදියරයෙහි ක්‍රියාකාරකම් 2020 පෙබරවාරි මස 01 වන දින ආරම්භ කරන ලදි.

ක්ෂේත්‍ර හතරක දී ප්‍රතිපල ලැබීමට මෙම ව්‍යාපෘතියෙන් ඉලක්ක කෙරෙයි. ශ්‍රී ලංකාවෙහි ආරවුල් නිරාකරණ යාන්ත්‍රණ වෙත පිවිසීමේ හැකියාව සහ ඒවායෙහි ඵලදායිතාව වැඩිදියුණු කිරීමටත්, සමාජ ඒකාබද්ධතාව සහ රාජ්‍ය හා ප්‍රජාව අතර වඩාත් ඇතුළත් සබඳතාවන් වෙනුවෙන් කටයුතු කිරීමටත් එයින් අදහස් කරයි.

යුරෝපා සංගමය විසින් අරමුදල් සපයනු ලබන SEDR ව්‍යාපෘතිය යනු, බ්‍රිතාන්‍ය කවුන්සිලය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), සහ ලෝක බැංකුව සමග හවුල්ව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කෙරෙන ප්‍රතියෝජනය, ප්‍රතිසන්ධාන සහ සියලූමදෙනාගේ ප්‍රජාතන්ත්‍රවාදී මැදිහත්වීම ශක්තිමත් කිරීමේ (STRIDE) වැඩපිළිවෙළට අයත් එක් අංගයකි.

### සමස්ථ අරමුණ

රජය සහ මහජනතාව අතර සංවාදය සවිමත් කිරීම මගින් ගැටුම් වලට පාදක වන මූලික හේතූන් නිරාකරණයට සහ ඒ ඒ පළාත්වල ආරවුල් ඉහළ යාම වැළැක්වීමට අවශ්‍ය දායකත්වය ලබාදීම.

### විශේෂිත අරමුණ

ප්‍රජා සහ තනි පුද්ගල මට්ටම්වලින් ඇති දුක්ගැනවිලි සම්බන්ධයෙන් ආරවුල් නිරාකරණ සේවාවන් වැඩිදියුණු කිරීම.

Part of the programme

STRIDE
STRENGTHENING TRANSFORMATION, RECONCILIATION AND INCLUSIVE DEMOCRATIC ENGAGEMENT

Funded by the European Union

Implemented by

BRITISH COUNCIL

The Asia Foundation

SEDR
Supporting Effective Dispute Resolution
ඵලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම
பயனுறுதிமிக்கவகையில் பிணக்கை
தீர்ப்பதற்கு ஆதரவளித்தல்

# ව්‍යාපෘති දැක්ම සහ ප්‍රතිඵල අපේක්ෂිත ක්ෂේත්‍ර

SEDR හි දැක්ම වනුයේ:

- ශ්‍රී ලංකාවෙහි ආරවුල් නිරාකරණ යාන්ත්‍රණ වෙත පිවිසීමේ හැකියාව සහ ඒවායෙහි ඵලදායිතාව වැඩිදියුණු කිරීමටත්,
- සමාජ ඒකාබද්ධතාව සහ රාජ්‍ය හා ප්‍රජාව අතර වඩාත් අන්තර්ගත සබඳතාවන් වෙනුවෙන් කටයුතු කිරීමටත්ය.

## RESULT AREA 1

තනි පුද්ගල ආරවුල් විසඳීම (පවුලක, සාපරාධී සහ ඊට අදාළ දේපල/මූලයමය ආරවුල්) සඳහා වන ප්‍රජා සමථ මණ්ඩල වල කටයුතු වැඩිදියුණුව.

## RESULT AREA 2

ඉඩම් සඳහා වූ විශේෂිත සමථ මණ්ඩල වල ක්‍රියාකාරකම් පුළුල් කිරීම සහ වැඩිදියුණුව.

## RESULT AREA 3

ඒ ඒ පළාතෙහි සැවොම ඇතුළත් වූ සංසද මගින් අන්‍යෝන්‍ය ගැටලු විසඳීමට කටයුතු කිරීම සහ ප්‍රජා-මට්ටමේ දුක්ගැනවිලි නිරාකරණ කටයුතු වල දියුණුව.

## RESULT AREA 4

නැවත පිරික්සීමේ නියෝජිතායතන සමග සම්බන්ධීකරණය, දත්ත එකතු කිරීමේ කටයුතු වල වැඩිදියුණුව සහ මැදිහත්වීමේ ක්‍රමවේදය භාවිත කෙරෙන්නේ මන්ද සහ කෙසේද යන්න පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම ආදිය හරහා සමථකරණ ක්‍රියාවලින්හි ප්‍රතිලාභ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවන්ට සහ නිලධාරීන්ට දැකගැනීමට අවස්ථාව උදා කිරීම.

## මූලෝපායික ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්

ව්‍යපෘති ක්‍රියාකාරකම් ජාතික හා ප්‍රාදේශීය යන තලයන් දෙක තුළම ක්‍රියාත්මක වේ. SEDR ව්‍යපෘතිය අභියෝගයන් දක්නට ලැබෙන පහත භූගෝලීය කලාප තුළ පවතින්නා වූ ආරවුල් නිරාකරණ යාන්ත්‍රණයන් දියුණු කිරීමට විශේෂිත වූ අවධානයක් යොමු කරනු ලැබේ.

- උතුරු පළාත
- නැගෙනහිර පළාත
- ඌව පළාත

## ව්‍යාපෘතියෙහි වර්ථමාන තත්වය

SEDR ව්‍යාපෘථියෙහි මූලික අදියර මෑත කාලයේ ආරම්භ කළ අතර එහි ක්‍රියාත්මක අවධිය 2021 පෙබරවාරි මාසය තුළ සිදු විය. ඊට අමතරව COVID-19 වසංගත තත්වයෙහි බලපෑමට මුහුණදීම සඳහා අනුගමනය කරනු ලබන පියවරයන්ට අනුකූලව SEDR හි ප්‍රතිචාරයන් ක්‍රියාත්මක කිරීමට ද වගබලාගනු ඇත.

SEDR

Supporting Effective Dispute Resolution

ඵලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම

பயனுறுதிமிக்கவகையில் பிணக்கை தீர்ப்பதற்கு ஆதரவளித்தல்

# මූලික ව්‍යාපෘති තේමාවන්

## අන්තර්ගත ප්‍රවේශය



ධරණීය ප්‍රතිඵල, සන්දර්භීය අදාළත්වය සහ සියලුම ආකාරයේ ඇතුළත්කිරීම් වෙනුවෙන් වූ විකල්ප ආරවුල් නිරාකරණ යාන්ත්‍රණයන්ට සහායවීම SEDR හි ප්‍රවේශය වෙයි. මෙම ඉලක්කයන් සපුරාගැනීම තහවුරු කිරීමට SEDR අනුගමනය කරනු ලබන විශේෂිත වූ ක්‍රමවේදයන් පහත ආකාරයට වෙයි.

- තරුණ ප්‍රජාව හා සම්බන්ධවීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රවර්ධනය කිරීම
- විවිධ ජනකොටස් ඇතුළත් කරගැනීම

## බලපෑම්සහගත හවුල්කාරිත්වය



ආසියානු පදනම (The Asia Foundation) සමග හවුල්කාරිත්වමයන් යුතුව SEDR කටයුතු කරනු ලබන්නේ, ආරවුල් නිරාකරණ විකල්ප ක්‍රමවේදයන් වශයෙන් මැදිහත්වීම් දිරිගන්වන අධිකරණ අමාතයාංශය වෙත ආසියානු පදනම විසින් පුරා වසර ගණනාවක් ලබාදී ඇති තාක්ෂණික සහය මත විශ්වාසය තබමිනි. SEDR හි ප්‍රතිපල ලැබීමට ඉලක්ක කෙරෙන ක්ෂේත්‍ර 1 සහ 2 ක්‍රියාවට නැංවීමෙහි නායකත්වය දරනු ලබන්මන් ආසියානු පදනම විසිනි. එහිදි ව්‍යාපෘතිය පහත ආයතන සහ පුද්ගලයන් සමඟ කටයුතු කරනු ලැබේ.

- සමථකරණ කොමිෂන් සභාව (MBC)
- සමථකරණ නිලධාරින් (MOs) සමථකරණ පුහුණු නිලධාරින් (MTOs) සහ සංවර්ධන නිලධාරින් - සමථකරණ (DOs)
- ප්‍රජා සමථකරුවන්
- විශේෂිත ඉඩම් සමථකරුවන්

# SEDR

Supporting Effective Dispute Resolution

ඵලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම

பயனுறுதிமிக்கவகையில் பிணக்கை தீர்ப்பதற்கு ஆதரவளித்தல்

@SEDRSriLanka

#MakeGreatSTRIDES

#SEDRtogether

Part of the programme

STRIDE — STRENGTHENING TRANSFORMATION, RECONCILIATION AND INCLUSIVE DEMOCRATIC ENGAGEMENT

Funded by the European Union

Implemented by

BRITISH COUNCIL

The Asia Foundation

මෙම ප්‍රකාශනය යුරෝපා සංගමයේ මූල්‍යාධාර තුළින් ප්‍රසිද්ධ කර ඇති අතර එහි අන්තර්ගතය පිළිබඳව වගකීම මුළුමනින්ම SEDR සතු වන අතර යුරෝපා සංගමයේ අදහස් නියෝජනයක් නොවේ.